# ඉතා දක්ෂ ගුරු මහත්මියක්

දේවිකා රූපසිංහ මහත්මිය මා සමග ශාක්‍යමුණි සම්බුද්ධ විහාරයේ දහම් පාසලේ ඉදිරා දිනවලත් වික්ටෝරියානු භාෂා පාසලේ සෙනසුරාදා දිනවලත් සේවය කළා ය. මෙසේ දශක එකහමාරක් පමණ කාලය සති අන්තවලදී අපි ගුරුවරුන් ලෙස හමුවීමු. ගුරුවරියක ලෙස දේවිකා ගේ කැපවීම හා දක්ෂතාව මා හඳුනාගත්තේ එසේ සේවය කරද්දී ය.

දේවිකා සිය සිසු දරු දැරියනට මවක සේ සෙනෙහස දැක්වූ ගුරු මහත්මියකි. සිය සිසු දරු දැරියන්ගේ රුචිකත්වය හඳුනාගෙන ඔවුන්ගේ මට්ටමට සුදුසු ක්‍රියාකාරකම් උපයෝගී කර ගනිමින් ඉගැන්වීමට දේවිකා දැක්වූයේ අසීමිත දක්ෂතාවකි. දේවිකා සිය ඉගැන්වීමේ කටයුතු ඉතාමත් දයාවෙන් හා කරුණාවෙන් ද සිනාමුසු මුහුණින්ද කළ නිසා ඇගේ සිසු දරු දැරියන් දේවිකාට දැක්වූයේ දැඩි භක්ත්‍යාදරයකි.

පන්තියේ ඉගැන්වීමේ කටයුතු වලට අමතරව තම සිසු සිසුවියන්ගේ සැඟවුණු විවිධ කුසලතා වැඩිදියුණු කිරීමටද දේවිකා මහන්සි වූවා ය. නව අදහස් හා සංකල්ප යොදා ගනිමින් උනන්දුවෙන් සිසුන් පුහුණු කළා ය. ඇගේ රංගන කුසලතාවත් රංගනය ඉගැන්වීමට තිබූ කුසලතාව හා ඉවසීමත් ඒ සඳහා ඇයට මහෝපකාරී විය.

දේවිකා සහෝදර ගුරුමහත්මීන්ට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සහෝදරියක් වූවා ය. ඔවුන්ගේ දුක්ඛ දෝමනස්ස වලදී ඔවුන් සමග දුක බෙදා ගනිමින් තමන්ට හැකි පමණින් පිහිට වූ ඇය සතුටේදී ඔවුන් හා ඒක්ව අවංකවම සතුටු වූවා ය.

ඇගේ අභාවය බෙරික්හි ශාක්‍ය මුණි සම්බුද්ධ විහාරයේ දහම් පාසලට මෙන්ම වික්ටෝරියානු භාෂා පාසලටත් මෙල්බන් සිංහල ප්‍රජාවටත් පිරිමැසිය නොහැකි පාඩුවකි

**රෝහිණී ජයකොඩි**

# වරෙකදී ගුරුතුමියකි වරෙකදී යෙහෙළියකි

වරෙකදී ගුරුතුමියකි වරෙකදී යෙහෙළියකි
වරෙකදී සොයුරියකි වරෙකදී ඇය මවකි
කරුණාගුණය උතුරා යන මෙත් විලකී
ගුරුතුමි දේවිකා අප හට සිතුමිණකි

මෙරටෙහි උපන් අප හට හෙළ බස දුන්නා
හෙළ සිරිතෙහි අගය පැහැදිලි කර දුන්නා
කරුණාවෙන් වැරදි නිවැරදි කර පෙන්නා
අපෙ ජය දකින ඇය සතුටින් ඉපිලෙන්නා

සැම අනියතයි අප බුදුහිමි දෙසු ලෙසට
ඔබ හැර ගියා අප සැම දෙන දෙව් ලොවට
දම් පාසලෙහි සිසු අප පතනෙමු ඔබට
අජරාමර නිවන් සුව ලබනා ලෙසට

*ශාක්‍යමුණි සම්බුද්ධ විහාරයේ දහම් පාසල් සිසු සිසුවියන් වෙනුවෙන්*

**ගාමිණී ලක්ෂ්මන් ගමගේ**

# ගුරු මෑණියනි

දේවිකා රූපසිංහ ගුරුතුමිය බෙරික් දහම් පාසලේ සහ කාවතා සිංහල භාෂා පාසලේ අපට දහම් දැනුම සිංහල භාෂාව නාට්‍ය ගීත ගායනය සහ නැටුම් ඉගැන්නුවාය. ඇය අපට ගුරුවරියක් විතරක් නෙවෙයි අම්මා කෙනෙක් වගේ හොඳ නරක කියා දුන්නා ය. ඇය හරිම දක්ෂ කරුණාවන්ත ගුරුවරියකි.

මට මතක් වන්නේ කාවතා සිංහල භාෂා පාසලේ 2009 විවිධ ප්‍රසංගයට ඇය අප පංතියෙන් නාට්‍යයක් සින්දුවක් සහ නැටුම් පුරුදු කළ හැටියි. විවිධ ප්‍රසංගයට කලින් දවසේ සවස ඇය අපගේ පුහුණුවෙන් පසු මෙහෙම කිව්වා. "ඔයාලා මම කියල දුන්න විදියට ලස්සනට ප්‍රසංගය කරන්න. මම ලංකාවට ගිහින් ඇවිත් වීඩියෝ පටිය බලලා සතුටු වෙන්නම්" කියලා ඇය අපට සුබ පැතුවා.

ගුරු මෑණියනි. අපි ඔබ ආපසු එන තුරු මඟ බලා සිටින්නෙමු.

ඒ දවස කවදාද

සඳුනි ද මැල්
7 වසර
කාවතා සිංහල භාෂා පාසල සහ බෙරික් දහම් පාසල

ඇඩ්වටයිස් in Sannasa

DIAMOND
MORTGAGE SERVICES
Best in the West
RESIDENTIAL
COMMERCIAL
BUSINESS
Home Loans & Refinancing
Low Doc Loans for self employed
Commercial Loans / Franchise Business Loans
Business/Car/Taxi Plate Loans
Personal Loans
Owner Builder Construction Loans
Short-term Loans for student visa matters &
Much, Much More.....
Accredited with more than 32 lenders
saamArt
PLAN
Contact: Nilanthi Jayasinghe
21, Toledo Crescent, Point Cook VIC 3030
Tel: 0404 852 405 Fax: 03 9394 8812
MFAA
Email: diamondfinance@optusnet.com.au

